**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2022**

**---------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 48 ඡේදය ප්‍රකාරව, ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවද, ඊට පටහැනිව ජාතික අක්ෂි බැංකුව විසින් විදේශීය රටවලට සපයා තිබුණු අක්ෂි පටල වෙනුවෙන් ලද ආදායම (Processing Charges) රු.63,255,479 ක් අක්ෂි පටල ගබඩා මාධ්‍ය සඳහා දරන ලද රු.4,355,052 ක වියදමෙන් හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ජාතික අක්ෂි බැංකුව විදේශ රටවලට අක්ෂි පටල සැපයීමේදී අක්ෂි පටල ගබඩා මාධ්‍ය සඳහා දරන ලද වියදම ඔවුන්ගෙන් වෙනමම අයකරනු ලබන බව, අක්ෂි පටල ගබඩා මාධ්‍ය සඳහා දරන ලද වියදම සත්‍ය වශයෙන්ම වියදමක් වන බැවින් එය අක්ෂි පටල වෙනුවෙන් ලද ආදායම් ගිණුමෙන් ගබඩා මාධ්‍ය වියදම් පාලන ගිණුමට 2022 වර්ෂය සඳහා වූ රු.4,355,050 වියදමක් ලෙස හඳුනාගෙන මාරු කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර ජාතික අක්ෂි බැංකුවේ පෙර වර්ෂ ගැලපීම් ලෙස එකතුව රු.5,331,981 ක ශේෂයක් 2022 ජනවාරි 01 දින ඉදිරියට ගෙනා සමුච්චිත අතිරික්තයට ගලපා තිබුණි. | ජාතික අක්ෂි බැංකුවේ ආදායම් හා වියදම් උපචිත පදනම මත හඳුනා ගෙන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් ගිණුම්ගත කළ යුතු වුවත්, 2010 ජාතික අක්ෂි බැංකුව ආරම්භයේ සිටම ගිණුම් ගත කර ඇත්තේ මුදල් පදනම මත බව හා එයින් ජාතික අක්ෂි බැංකුවේ සමුච්චිත අරමුදල 2022 ජනවාරි 01 වන විට රු.5,331,981 කින් අධිතක්සේරු වී තිබුණු අතර එය 2022 ජනවාරි 01 දින ඉදිරියට ගෙන ආ සමුච්චිත අතිරික්තයට ගළපා ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ හා ජාතික අක්ෂි බැංකුවේ එකතුව රු.4,291,988 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඇතැම් ස්ථාවර වත්කම් දැනට භාවිතයෙන් ඉවත්කර ඇති අතර තවදුරටත් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි තත්වයේ ඇති බව තහවුරු වී ඇති බව, 2023 වර්ෂයේදී මෙම වත්කම් අපහරණය කිරීමට කටයුතු කරනු ඇති බව හා ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂයක් නොමැති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් බොල් ණය ප්‍රතිපාදනය සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණු අතර 2005 වර්ෂයේදී මීගහකිවුල රෝහලේ වාට්ටු සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් නොකිරීම හේතුවෙන් පෞද්ගලික රක්ෂණ සමාගමකින් ලැබිය යුතු කාර්යසාධන සුරක්ෂණ ඇපකරයේ වටිනාකම රු.1,372,346 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සියයට 100 ක බොල් හා අඩමාණ ණය වෙන්කිරීමක් සිදු කර තිබුණි. | මුදල සියයට 100 ක බොල් හා අඩමාණ ණය වෙන්කිරීමේ පදනම වනුයේ 2010 ඔක්තෝබර් 26 වන දින වන විට කාර්යයසාධන සුරක්ෂණ ඇපකරයෙහි කාලය ඉකුත් වී ඇති බැවින් රු.1,372,346 ක මුදල ගෙවිය නොහැකි බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) වෙත සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් දන්වා ඇති බව, ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ බොල් හා අඩමාණ ණය වෙන් කිරීමේ පදනම ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර අංක 8 හි 22 ඡේදය අනුව නිවැරදිව හඳුනාගෙන ඇති බව, | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුනාගෙන හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂා රෝහල විසින් කිසිදු බිල්පතක් ඉදිරිපත් කර නොතිබියදී අපේක්ෂා රෝහලේ බාහිර පාර්ශ්වයන්ට ගෙවීම් කිරීමට රු.202,309,478 ක මුදලක් අපේක්ෂා රෝහල සඳහා වූ පරිත්‍යාග ගිණුමෙන් අඩුකර උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අපේක්ෂා රෝහලේ CT Stimulator යන්ත්‍රයක් සඳහා රු.202,309,478 ක මුදලට අදාල තාක්ෂණික කමිටු වාර්තාද ඇතුළු ලියකියවිලි 2022 දෙසැම්බර් 16 වන දින ඉදිරිපත් කර ඇති බව හා එම වියදම් 2022 දෙසැම්බර් 31 දින වන විටක් උපචිතව පැවතුණු බැවින් එම වියදම් ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර අංක 1 අනුව නිවැරදි ආකාරයෙන් වියදමක් ලෙස හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ දී ගිණුම් ගත කර ඇති බව. | උපචිත වියදම් නිවැරදි ආකාරයෙන් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක අමප/12/0489/509/022 දරන 2012 මැයි 04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව උතුරු පළාතේ පිළිකා රෝගීන් සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා (Trail Project) සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සහ ආධාරක ආයතනය වන Colours of Courage Trust භාරකාර අරමුදල යන සිව් පාර්ශවයන් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුම අනුව යාපනය ශික්ෂණ රෝහලේ හා තෙලිප්පලේ මූලික රෝහලේ පිළිකා ඒකක සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වී තිබුණි. මේ යටතේ තෙලිප්පලේ මූලික රෝහලේ විකිරණ ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම හා යාපනය ශික්ෂණ රෝහලේ ළමා ප්‍රතිකාර ඒකකය සඳහා අවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබාදීමට යෝජිතව පැවතුණි. විගණනයට ලද තොරතුරු අනුව තෙලිප්පලෙයි රෝහලේ විකිරණ ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම වෙනුවෙන් වැය කළ රු.මිලියන 244.5 න් රු.මිලියන 218.6 ක් Colours of Courage Trust ආයතනය ආධාර වශයෙන් ලබා දී තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය යටතේ එකතු කරනු ලබන සියළු මුදල් හා තැන්පත් කරනු ලබන මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වත්කමක් වන අතර ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඉතිරි මුදල් යාපනය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකයේ වැඩිදියුණු කිරීම් සඳහා යෙදවිය යුතුව තිබුණද, Jaffna Project නමින් ඉහත භාරකාර අරමුදල වෙතින් 2022 මාර්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ එකතු කරන ලද රු.මිලියන 62.16ක මුදලක් මෙතෙක් අදාල ගිවිසුමේ කාර්යයන් ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු නොකර උක්ත Colours of Courage Trust භාරකාර අරමුදල භාරයේ රඳවාගෙන තිබුණි. | 2023 දෙසැම්බර් 06 දින සෞඛ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ Colours of Courage Trust සහභාගිත්වයෙන් පැවති සාකච්ඡාවේදී උක්ත ආයතනය ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව දැන්වූ නමුත් මේ දක්වා 2022 මාර්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ එකතු කරන ලද රු.මිලියන 62.16 ක මුදල මෙතෙක් අරමුදල වෙත ලබා දී නොමැති බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සංස්ථාමය පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 2.3 මාර්ගෝපදේශය | පනතේ අරමුණු ඉටුකරගත හැකිවන ලෙස උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව එවැනි සැලැස්මක් සකස්කර නොතිබුණි. | ජා.සෞ.සං. අරමුදලේ අරමුණ ඉටුකර ගත හැකි වන පරිදි 2022 වර්ෂයේ උපායමාර්ගික සැලැස්ම පිළියෙල කර ඇති බව, | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 3(2)(ඉ) වගන්තිය | අරමුදලේ පරිපාලනය, කළමණාකරණය සහ පාලනය සඳහා පනතේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යවරයා විසින් භාරකාර මණ්ඩලය සඳහා පත්කරනු ලබන සාමාජිකයින්ගෙන් එක් සාමාජිකයෙකු 2021 සැප්තැම්බර් 21 දින සිට සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වී තිබුණු අතර 2020 පෙබරවාරි 11 දින පත්කර තිබුණු එක් සාමාජිකයෙකු භාරකාර මණ්ඩලයේ රැස්වීම් සඳහා සහභාගිවී නොතිබුණි. මේ සඳහා නව සාමාජිකයින් පත්කිරීමට මෙම වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සෞඛ්‍ය ලේකම් සභාපති ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල මගින් සෞඛ්‍ය අමාත්‍යවරයාව සමාලෝචිත වර්ෂයේ දී දැනුවත් කිරීමට පියවර ගෙන තිබුණු බව. | පුරප්පාඩු වී ඇති භාරකාර මණ්ඩල තනතුරු සඳහා කඩිනමින් නව සාමාජිකයින් පත්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 7 වන වගන්තිය | අරමුදල් පනතේ කාර්යයන්හි විෂයපථයට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,000,000 ක් සංගමයක් වෙත ප්‍රදානය කර තිබුණි. | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 7 (ආ) අනුව ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂණ සේවාවල නිරතව සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම සඳහා අරමුදල් ලබාදිය හැකි බව, INPALMS 2022 හි අරමුණ වනුයේ Legal Medicine, Forensic Science යන ක්ෂේත්‍රවල අධ්‍යාපනය හා පර්යේෂණය වෙනුවෙන් බව හා ඒ අනුව නීති රීති වලට පටහැනිව ක්‍රියාකර නොමැති බව. | පනතෙහි දක්වා ඇති කාර්යයන්හි විෂයපථයට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් සඳහා මූල්‍යාධාර ලබා නොදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.164,877,522 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.188,434,937ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,557,415 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ අරමුදල් හා වෙනත් මාරු වියදම් රු.1,596,342,339 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පිහිටුවීමට සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමඟ 2010 වර්ෂයේදී එළඹ තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව හා ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා 2013 අගෝස්තු 29 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පනතක් මඟින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීමට හා එහි ගනුදෙනු වාර්තා කිරීම සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට 2023 ජූලි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | කැබිනට් පත්‍රිකා අංක 13/1172/509/052 හි දක්වා ඇති අමාත්‍ය මණ්ඩල තීරණය වනුයේ ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව (ශ්‍රී.ලං.ජා.අ.බැ) භාරයක් ලෙස ස්ථාපිත කරන තුරු ව්‍යාපෘතියක් ලෙස පවත්වා ගැනීම බව හා භාරය ලෙස ස්ථාපනය කිරීමට අදාල කැබිනට් පත්‍රිකා, පනත සහ ඊට අදාල නීතිමය කටයුතු නීති අංශය මඟින් කරගෙන යන බවට දන්වා ඇති බව. | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව වෙනම ආයතනික ව්‍යුහයක් සහිත නෛතික ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපිත කරන තෙක් එහි කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමටද, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කාර්යමණ්ඩලය බඳවා ගැනීමට හා වැටුප් ගෙවීමටද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකීමට අවශ්‍ය කොන්දේසි සම්පූර්ණවී නොතිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කළ නොහැකිව තිබුණු අතර අක්ෂි භාරය පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත සඳහා 2022 අගෝස්තු 15 දින අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාරය ලෙස ස්ථාපනය කිරීමට අදාල කැබිනට් පත්‍රිකා, පනත සහ ඊට අදාල නීතිමය කටයුතු නීති අංශය මඟින් කරගෙන යන බවට දන්වා ඇති බව. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව, ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි බවත්, ඒ අනුව කාර්ය මණ්ඩලය බඳවාගත නොහැකි බවත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතු අතර ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2011 මාර්තු 23 දිනැති අංක අමප/11/0465/509/056 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් රු.මිලියන 4.68 ක ඇස්තමේන්තු මුදලකට අම්පාර මහ රෝහල සතු ගොඩනැගිල්ලක් අළුත්වැඩියාකර ගෙවන වාට්ටුවක් ඉදිකිරීම සඳහා අනුමැතියක් ලබාදී තිබුණද, ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කරනවා වෙනුවට කාමර 8 කින් සමන්විත බිම් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් රු.මිලියන 18.20 ක් වැයකර තිබුණි. උක්ත අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව ගෙවන වාට්ටු ආදායමින් සියයට 60 ක් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට බැර කිරීමටත් ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමටත් තීරණය කර තිබුණි. 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණු මෙම ගෙවන වාට්ටුවෙන් 2018 සිට 2021 දක්වා ලද මුළු ආදායම රු.2,113,931 ක්වූ අතර සමාලෝචිත වර්ෂයේ කිසිදු ආදායමක් නොලබා නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ රටේ උද්ගතව පැවති තත්වය හේතුවෙන් ගෙවන වාට්ටුව සඳහා රෝගීන් ඇතුළත් වී නොමැති බැවින් ආදායම් ලබා නොමැති බව මහා රෝහල අම්පාර විසින් අරමුදල වෙත දන්වා ඇති බව. | ඵලදායී ව්‍යාපෘති සඳහා අරමුදලේ මුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග ගිණුමේ පැවති රු.1,080,398,675 ක ශේෂය තුළ මහරගම පිළිකා රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල සහ අංගොඩ මානසික රෝහල සහ IDH රෝහල්වලට, විවිධ පුද්ගලයින් හා ආයතනවලින් විවිධ කාර්යයන් වෙනුවෙන් පසුගිය වර්ෂයන් තුළ හා සමාලෝචිත වර්ෂය තුළ ලද පරිත්‍යාග මුදල් එකතුව රු.899,119,214 ක් අදාල කාර්යයන්ට නොයොදවා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරිමට කටයුතු කර තිබුණි. | නිශ්චිත කාර්යයන් සඳහා ලැබෙන පරිත්‍යාග, අරමුදල වෙත ලැබෙන්නේ අදාල ආයතන ප්‍රධානීන්ගේ දැනුවත් බව මත වන අතර එම ආයතන ප්‍රධානීන්ගේ දැනුම් දීම් මත භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකරන අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආයතනවල ඉල්ලීමට පටහැනිව අදාල කාර්යයන්ට නොයොදවා දීර්ඝ කාලයක් තිස්සේ අරමුදල් රඳවා තබා ගැනීමක් සිදුවී නොමැති බව. | අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විගණනයට ලැබුණු තොරතුරු අනුව 1997 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අරමුදල වෙත විවිධ ව්‍යාපෘති 09 කට අදාලව ලැබී තිබුණු පරිත්‍යාග එකතු ශේෂය 2018 දෙසැම්බර් 31 දිනට රු.12,266,239 ක් වූ අතර පසුගිය වර්ෂ 04 තුළ මෙම අරමුදල් වලින් කිසිදු වියදමක් අදාල ව්‍යාපෘති වෙනුවෙන් වැයකර නොතිබුණි. | එම විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ බලධරයා වනුයේ අදාල පරිත්‍යාග ලබන ආයතන ප්‍රධානීන් මඟින් බව, අදාල ආයතන ප්‍රධානීන් එම කාර්යන් ක්‍රියාත්මක කළ යුතු වන අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ බලයක් අරමුදල සතු නොවන බව. | අදාල ආයතන දැනුවත් කර අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය. |
| (ඇ) | 1998 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා විවිධ කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් අරමුදලට ලැබුණු එකතුව රු.55,745,076 ක්වූ පරිත්‍යාගයන් 05 ක මුදල් අරමුණුගත කාර්යයන් ඉටු කිරීම සඳහා යෙදවීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන තෙක් කටයුතු කර නොතිබුණි. | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 6 වන සහ 7 (ඇ) වගන්ති අනුව විශේෂ යෝජනා ක්‍රමයක් වෙනුවෙන් ලැබෙන පරිත්‍යාග අරමුදල වෙත බැර කෙරෙන අතර එම විශේෂ ව්‍යාපෘති සඳහා රජයේ විධිවිධානවලට අනුකූලව ගෙවීම පමණක් ජා.සෞ.සං අරමුදලේ කාර්යය වන බව හා එම විශේෂ ව්‍යාපෘති අදාල ආයතනය මඟින් ක්‍රියාත්මක කළ යුතු වන අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ බලයක් අරමුදල සතු නොවන බව. | අදාල ආයතන දැනුවත් කර අරමුදලේ මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකාව තුළ ජාතික හියුමන් පැපිලෝමා වයිරස් එන්නත ලබාදීමේ දැනට පවතින පිරිවැය සහ මෙහෙයුම් සන්දර්භය ඇඟයීමේ ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ Path සංවිධානය විසින් අවස්ථා දෙකකදී එකතුව රු.18,342,050 ක මුදලක් ප්‍රදානයන් ලෙස සෞඛ්‍ය සංවර්ධන අරමුදලට ලබා දී තිබුණි .මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක Scl/Pmu/Grant/19 හා 2019 ජූලි 25 දිනැති ලිපිය පරිදි ඉහත මුදලින් රු.7,179,900 ක විදේශ ප්‍රදාන පිළිබඳව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක Scl/Pmu/Grant/19 හා 2019 ජූලි 25 දිනැති ලිපිය පරිදි රු.7,179,900 ක විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් කටයුතු කරනු ඇති බව. | මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුකූලව කටයුතු කළ යුතුය. |

(ඉ) 2022 ජනවාරි 01 දිනට අපේක්ෂා රෝහල සඳහා වූ පරිත්‍යාග ගිණුමේ රු.280,187,967 ක මුදලක් පැවති අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | 2015 වර්ෂයෙහි ළමා වාට්ටුවක් ඉදිකිරීම වෙනුවෙන් පරිත්‍යාග කළ රු.25,500,000 ක පෞද්ගලික ප්‍රදානයක් හා 2019 වර්ෂයේ Thormotheropy යන්ත්‍රය මිලදී ගැනීමට ලද රු.127,990,440 ක මහජන ආධාර මුදල් අදාල කාර්යයන් ඉටුකිරීම සඳහා යොදවා නොතිබුණි. | දිලිනි ද සිල්වා මියගේ අන්තිම කැමති පත්‍රය අනුව ළමා වාට්ටුවක් ඉදිකිරීම රු.25,550,000 ක මුදල සහ Thormotheropy යන්ත්‍රය මිලදී ගැනීමට ලැබී ඇති මහජන ආධාර රු.127,990,440 ක මුදල් ඇතුළු අපේක්ෂා රෝහල මහරගම පරිත්‍යාග ශේෂය යොදවා CT Simulators යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ, අපේක්ෂා රෝහල විසින් අරමුදල දැනුවත් කර ඇති බව හා මේ සම්බන්ධව කටයුතු කරගෙන යන බව . | අරමුදලේ මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පවතින ආර්ථික අර්බුදය හමුවේ රෝගී සත්කාර සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා Thormotheropy යන්ත්‍රය මිලදී ගැනීමට රැස්කළ ආධාර මුදල් හා Pet Scan යන්ත්‍රය මිලදී ගැනීමෙන් පසුව ඉතිරි වූ මුදල් උපයෝජනය කර CT Simulators යන්ත්‍රයක් මිලදී ගැනීමට, එම යන්ත්‍රය ස්ථාපිත කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා Sonial vision X ray යන්ත්‍රය ස්ථාපිත කිරීමට නියමිත ගොඩනැගිල්ල සඳහා විදුලි සැපයුම ලබා ගැනීම යන කාර්යයන් ඉටුකිරීමට රු.202,309,478 ක් අවශ්‍ය බව 2022 ජුනි 29 දිනැති ලිපියක් මඟින් අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර තිබුණි. එම කාර්යයන් සඳහා නිර්දේශ ලබා දීමට පත්කළ කමිටුවේ 2022 දෙසැම්බර් 13 දිනැති නිර්දේශය පරිදි 2022 දෙසැම්බර් 16 දින අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මඟින් අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට ඉල්ලීමක් කර තිබුණද උක්ත කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2023 ජූලි 18 දින | දිලිනි ද සිල්වා මියගේ අන්තිම කැමති පත්‍රය අනුව ළමා වාට්ටුවක් ඉදිකිරීම රු.25,550,000 ක මුදල සහ Thormotheropy යන්ත්‍රය මිලදී ගැනීමට ලැබී ඇති මහජන ආධාර රු.127,990,440 ක මුදල් ඇතුළු අපේක්ෂා රෝහල මහරගම පරිත්‍යාග ශේෂය යොදවා CT Simulators යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ, අපේක්ෂා රෝහල විසින් අරමුදල දැනුවත් කර ඇති බව හා මේ සම්බන්ධව කටයුතු කරගෙන යන බව. | අරමුදලේ මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලට PCR Testing Machine මිලදී ගැනීම සඳහා පරිත්‍යාගශීලී ආයතන කිහිපයක් විසින් ලබා දී තිබුණු එකතුව රු.27,192,285 ක මුදලින් රු.6,783,190 ක්වූ ඉතිරි මුදල 2022 දෙසැම්බර් 31 දින වනවිටත් අදාල කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලට රු.6,783,190 පරිත්‍යාග වියදම් කිරීමේ බලය ඇත්තේ අධ්‍යක්ෂ දිස්ත්‍රික් මහ රෝහල හම්බන්තොට වන අතර ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල මඟින් කිසිදු ආකාරයකින් රඳවා තබා ගෙන නොමැති බව හා මේ ශේෂ පිළිබඳ අධ්‍යක්ෂ දිස්ත්‍රික් මහ රෝහල හම්බන්තොට වෙත අරමුදල මඟින් දැනුවත් කර ඇති බව. | අරමුදලේ මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

(උ) ජාතික අක්ෂි බැංකුවේ 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ කාර්යසාධනය පහත දැක්වේ.

| වර්ෂය | 2020 | | | 2021 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| එකතු කරනු ලැබූ අක්ෂි පටල (කුනීත) සංඛ්‍යාව | 1014 | | | 665 | | | 1010 | | |
| අක්ෂි පටල (කුනීත) භාවිතය | **ඉල්ලුම** | **සැපයුම** | **සැපයුම් ප්‍රතිශතය** | **ඉල්ලුම** | **සැපයුම** | **සැපයුම් ප්‍රතිශතය** | **ඉල්ලුම** | **සැපයුම** | **සැපයුම් ප්‍රතිශතය** |
| රජයේ රෝහල් | 791 | 571 | 72 | 686 | 294 | 43 | 767 | 454 | 59 |
| පෞද්ගලික රෝහල් | 257 | 189 | 74 | 256 | 124 | 48 | 357 | 195 | 55 |
| විදේශීය රටවල් | 220 | 185 | 84 | 269 | 223 | 83 | 344 | 325 | 94 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | 2020 වර්ෂයට සාපේක්ෂ 2021 වර්ෂයේදී අක්ෂි බැංකුව විසින් එකතු කරනු ලැබූ අක්ෂි කුනීත සංඛ්‍යාව සියයට 34 කින් අඩුවී තිබුණු අතර 2022 වර්ෂයේදී 2021 වර්ෂයට සාපේක්ෂව එම සංඛ්‍යාව සියයට 52 කින් වැඩි වී තිබුණි. | ජාතික අක්ෂි බැංකුව සීමිත සේවක සංඛ්‍යාවක් සමඟින් කටයුතු කරනු ලබන බව, ජාතික අක්ෂි බැංකුව වැඩි අවධානයක් යොමු කරන්නේ දේශීය කුනීත සැපයීම් සඳහා බව. | දේශීය කුනීත අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2020 වර්ෂයේදී රජයේ රෝහල් වලින් අක්ෂි කුනීත සඳහා කරන ලද ඉල්ලුමෙන් සියයට 72 ක්ද, 2021 වර්ෂයේදී සියයට 43 ක්ද, 2022 වර්ෂයේදී සියයට 59 ක්ද, පමණක් වශයෙන් සපයා තිබුණි. | ජාතික අක්ෂි බැංකුව සීමිත සේවක සංඛ්‍යාවක් සමඟින් කටයුතු කරනු ලබන බව, ජාතික අක්ෂි බැංකුව වැඩි අවධානයක් යොමු කරන්නේ දේශීය කුනීත සැපයීම් සඳහා බව. | දේශීය කුනීත අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |
| (iii) | 2020 වර්ෂයේදී දේශීය පෞද්ගලික රෝහල් විසින් කරන ලද ඉල්ලුමෙන් සියයට 74 ක්ද, 2021 වර්ෂයේදී සියයට 48 ක්ද, 2022 වර්ෂයේදී සියයට 55 ක්ද ලෙස සපයා තිබුණි. | ජාතික අක්ෂි බැංකුව සීමිත සේවක සංඛ්‍යාවක් සමඟින් කටයුතු කරනු ලබන බව, ජාතික අක්ෂි බැංකුව වැඩි අවධානයක් යොමු කරන්නේ දේශීය කුනීත සැපයීම් සඳහා බව. | දේශීය කුනීත අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |
| (iv) | 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ විදේශීය රටවලින් අක්ෂි කුනීත සඳහා කරන ලද ඉල්ලුමෙන් සියයට 83 සිට සියයට 94 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් සපයා තිබුණි. මේ අනුව දේශීය ඉල්ලුම සඳහා කරන ලද සැපයීමට සාපේක්ෂව විදේශිය රටවල ඉල්ලුම සැපයීමට අක්ෂි බැංකුව වැඩි අවධානයක් යොමු කර තිබුණු බව නිරීක්ෂණය විය. | ජාතික අක්ෂි බැංකුව සීමිත සේවක සංඛ්‍යාවක් සමඟින් කටයුතු කරනු ලබන බව, ජාතික අක්ෂි බැංකුව වැඩි අවධානයක් යොමු කරන්නේ දේශීය කුනීත සැපයීම් සඳහා බව. | දේශීය කුනීත අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 306.2 ක්වූ කාර්යයන් 09ක් ඉටුකිරීමට අපේක්ෂා කර තිබුණද ඉන් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 248.2 ක්වූ කාර්යයන් 07 ක් වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. එසේම ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා නංවාලීම වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය කරගැනීම දුර්වල තත්ත්වයක පැවතුණු අතර 2022 දෙසැම්බර් 31 දින වනවිට පොදු අරමුදලේ සමුච්චිත ආදායම රු.608,943,133 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී පොදු අරමුදලින් වැයකර තිබුණු මුදල රු.141,871,323 ක් පමණක් විය. මේ අනුව අරමුදලේ මුදල් උපයෝජනය සියයට 23 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ භාරකාර මණ්ඩලය විසින් අනුමත කළ ක්‍රියාකාරී සැලැස්මේ වටිනාකම වනුයේ රු.මිලියන 206 කි. රු.මිලියන 96.2 වන අතිරේක කාර්යයන් දෙක අරමුදල් ඇත්නම් පමණක් ක්‍රියාත්මක කරන ලෙස භාරකාර මණ්ඩලයෙන් උපදෙස් ලබා දී ඇති බව. | පොදු අරමුදලේ මුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.449,988,680 ක් ලොතරැයි ආදායම ලෙස ලැබී තිබුණු අතර එකී කාලපරිච්ඡේදය තුළ රෝහල් උපකරණ මිලදී ගැනීම හා රෝහල් අළුත්වැඩියා කිරීම ආදී අරමුණුගත කාර්යයන් සඳහා එකතුව රු.241,948,616 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව ලොතරැයි ආදායම උපයෝජනය සියයට 54 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට මූලික වශයෙන් මුදල් ලැබෙනුයේ ලොතරැයි ආදායම මඟින් වන අතර අරමුදල පරිපාලනය කිරීම සඳහා දරන වියදම්ද අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් යොදා ගැනීමද ලොතරැයි ආදායම මඟින් සිදුවන බව. | සෞඛ්‍ය සංවර්ධන ලොතරැයිය මඟින් ලැබෙන ආදායම් එම ලොතරැයියේ අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝජනය කළ යුතුය. |